**බදුල්ල, හාලි ඇළ සහ ඇල්ල සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2013**

---------------------------------------------------------------------------------------------

බදුල්ල, හාලි ඇළ සහ ඇල්ල සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතියේ 2013 මාර්තු 01 සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එක්සත් ජනපදයේ අපනයන/ ආනයන බැංකුව හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව අතර එළඹි 2013 ජූලි 01 දිනැති අංක ඒපී086903එක්ස්එක්ස් හා 2013 නොවැම්බර් 06 දිනැති අංක 3294 දරන ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් වලට අනුව, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීම හා ඉදිකිරීම මගින් සුරක්ෂිත පානීය ජලය සැපයීම හා එමගින් ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට හා ප්‍රදේශයේ දුප්පත්කම අඩු කරලීමට දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 11,809.51 කට සමාන එ.ජ.ඩො. මිලියන 91.37 ක් වූ අතර ඉන් රු. මිලියන 8,356.53 කට සමාන එ.ජ.ඩො.මිලියන 64.89 ක් හෝ සියයට 70.77 ක් එක්සත් රාජධානියේ අපනයන/ ආනයන බැංකුව විසින් සැපයීමට එකඟ වී ඇති අතර රු. මිලියන 1,213.98 කට සමාන එ.ජ.ඩො.මිලියන 9.26 ක් හෝ සියයට 10.28 ක් ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසින් සැපයීමට එකඟ වී ඇත. ඉතිරි රු. මිලියන 2,239 කට සමාන එ.ජ.ඩො. මිලියන 17.22 ක් හෝ සියයට 18.95 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු ණය ගිවිසුම් වලට එළඹීමට පෙර 2012 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණු අතර 2017 අගෝස්තු 31 අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්

කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 මාර්තු 01 සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 අනුව, 2014 මාර්තු 31 හෝ එදිනට පෙර විගණකාධිපති වෙත එවීමට නියමිත 2013 දෙසැම්බර් 31 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2015 අප්‍රේල් 07 දිනදීය.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ප්‍රතිපාදිත අරමුදල් අතුරින් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී රු. 476,356 ක පිරිවැයකට ඌව ප්‍රාදේශීය උපකාරක මධ්‍යස්ථානය විසින් ප්‍රසම්පාදිත ස්ථාවර වත්කම් මහියංගණ ජල සම්පාදනය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය නමින් වෙනත් ව්‍යාපෘතියක වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. තවද, වාර්ෂික භෞතික සත්‍යාපන අවස්ථාවේදී අදාල වත්කම්

තහවුරු කළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඊට අමතරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු වෙනුවෙන් ඌව ප්‍රාදේශීය උපකාරක මධ්‍යස්ථානය විසින් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ වියදම් කළ රු. මිලියන 1.47 ක් වටිනා වෙනත් වියදම් වෙනත් ව්‍යාපෘතියක වියදම් ලෙස සලකා තිබුණි.

(ආ) ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සඳහා 2014 ජනවාරියේදී සිදු කළ රු. මිලියන 16.05 ක් වටිනා අත්තිකාරම් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ සිදු කළ අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2013 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි අත්තිකාරම් ශේෂය එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත වෙන්කිරීම සහ 2013 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වලට අනුව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය 2013 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| එක්සත් ජනපදයේ අපනයන/ ආනයන බැංකුව | 64.89 | 8,356.53 | 800.00 | - | - |
| හැටන් නැෂනල් බැංකුව | 9.26 | 1,213.98 | - | 9.26 | 1,213.98 |
| ශ්‍රී.ලං.ර | 17.22 | 2,239.00 | 292.70 | 0.21 | 26.84 |
| **එකතුව** | **91.37** | **11,809.51** | **1092.70** | **9.47** | **1,240.82** |

**3.2 භෞතික ප්‍රගතිය**

**-------------------**

2012 දෙසැම්බර් 25 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණද, ණය ගිවිසුම් ඇතිකර ගැනීමෙන් පසුව 2014 මාර්තු වලදී ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. පසුව කොන්ත්‍රාත් ගිවිසුම් 2014 ඔක්තෝබර් 24 දින සංශෝධනය කර ඇත. ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කළ ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත කාල පරිච්ඡේදය අවසානයේදී සැලකිය යුතු භෞතික ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩු දෙන ස්වභාවයේ කරුණු**

**------------------------------------------------**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) 2013 නොවැම්බර් 07 දිනැති ලිපිය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් කළද මූල්‍යාමය හා ක්‍රියාත්මක කිරීමේ අරමුණු සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා ශ්‍රී ලංකා රජය අතර අතුරු ණය ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය එහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබුණද, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමිකය ගණනය කර තිබුණු අතර පොදු කාර්ය වියදම් වලින් සියයට 20 ක් ව්‍යාපෘතියෙන් අය කරගෙන තිබුණි. ව්‍යාපෘතිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත කාල පරිච්ඡේදය සඳහා එසේ ගෙවූ පොදු කාර්ය වියදම් වටිනාකම රු. මිලියන 4.47 කි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සඳහා 2012 සහ 2013 කාලය තුළ ව්‍යාපෘතිය විසින් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු. මිලියන 19.05 ක් ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වෙතත් අත්පත් කර ගත් ඉඩම් වල අයිතිය 2015 දෙසැම්බර් 31 දින වන විටත් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරා දී නොතිබුණි.